# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1985 අංක 32 දරන
## දිළිඳු සහන පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1985 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

## 1985 අංක 32 දරන දිළිඳු සහන පනත

[සහතිකය සටහන් කළේ 1985 අගෝස්තු මස 14 වන දින.]

එල්. ඩී.—ඕ. 27/85

**දිළිඳු සහන වඩාත් විධිමත් කිරීම සහ පරිපාලනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1985 අංක 32 දරන දිළිඳු සහන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

2. (1) (අ) මේ පනතෙහි කාර්ය සඳහා (මෙහි මින්මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) දිළිඳු සහන කොමසාරිස්වරයකු නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයකු පත් කරන තෙක් සහ පත් කරන්නේ නම් මිස, සමාජ සේවා අධ්‍යක්ෂවරයා විසින් මේ පනතින් කොමසාරිස්වරයා වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි දිළිඳු සහන නියෝජ්‍ය කොමසාරිස්වරයන් සහ සහකාර කොමසාරිස්වරයන් සංඛ්‍යාවක් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(3) තමාගේ පත්වීම අදාළ වන්නේ කුමන පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා ද, ඒ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සෑම දිසාපතිවරයකු විසින්, මේ පනතින් නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය. තමාගේ පත්වීම අදාළ වන්නේ කුමන පරිපාලන කොට්ඨාසයක් සඳහා ද ඒ කොට්ඨාසය සම්බන්ධයෙන් සෑම උප දිසාපතිවරයකු විසින් ම, මේ පනතින් සහකාර කොමසාරිස්වරයකු වෙත පිරිනමන ලද හෝ නියම කරන ලද හෝ පවරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියට යටත්ව, මුළු ශ්‍රී ලංකාවම සඳහා හෝ එහි යම් කොටසක් සඳහා යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු පත් කරනු ලැබිය හැකි ය.

(5) මේ පනත පරිපාලනය කිරීමෙහිලා ඉහත කී නිලධරයන්ට සහාය වීම පිණිස අවශ්‍ය වන ලිපිකාර සහ කණිෂ්ඨ සේවක කාර්ය මණ්ඩල ද පත් කර ගනු ලැබිය හැකි ය.

නිලධරයන්ගේ බලතල හා කාර්ය.

3. (1) සෑම දිළිඳු සහන නියෝජ්‍ය කොමසාරිස්වරයකුම සහ සහකාර කොමසාරිස්වරයකුම සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී සහ කර්තව්‍ය කිරීමේ දී කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත් විය යුතු ය.

(2) සෑම දිළිඳු සහන නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ම සහ සහකාර කොමසාරිස්වරයකු විසින් ම, කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, සිය පත්වීමේ ප්‍රදේශය ඇතුළත, මේ පනත මගින් හෝ යටතේ කොමසාරිස්වරයාට පිරිනමා හෝ පනවා ඇති හෝ පැවරී ඇති සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය හෝ ඒවායින් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම කරනු ලැබිය හැකි ය.

මේ පනත අදාළ කිරීම.

4. මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුව දිළිඳු සහන සඳහා ඉල්ලුම් කරන හෝ දිළිඳු සහන ලබන්නා වූ සෑම තැනැත්තකුම, මේ පනතේ මින් මතු “මේ පනත අදාළ වන තැනැත්තා” යනුවෙන් හඳුන්වනු ලැබේ.

මේ පනත අදාළ වන තැනැත්තා විසින් කරනු ලබන ප්‍රකාශය.

5. මේ පනත අදාළ වන තැනැත්තාට මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ දිළිඳු සහන ප්‍රදානය කරනු ලැබීමට සුදුසු දැයි නිශ්චය කිරීමේ කාර්ය සඳහා ඒ තැනැත්තාගේ, ඔහුගේ කලත්‍රයාගේ, දරුවන්ගේ සහ වෙනත් යැපෙන්නන්ගේ වත්කම් සහ බැරකම් ද නියම කරනු ලැබිය හැකි වෙනත් තොරතුරු ද පිළිබඳ ප්‍රකාශයක්, නියම කරනු ලබන ආකෘතියක සහ ආකාරයට කරන ලෙස මේ පනත අදාළ වන සෑම තැනැත්තකුටම කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

තොරතුරු ඉල්ලා සිටීමට කොමසාරිස්වරයාට ඇති බලය.

6. 5 වන වගන්තිය යටතේ තමා වෙත කර ඇති යම් ප්‍රකාශයක අඩංගු යම් විස්තරයක නිරවද්‍යතාවය නිශ්චය කිරීම පිණිස අවශ්‍ය විය හැකි යම් තොරතුරක් දැන්වීමෙහි සඳහන් කරනු ලබන කාලයක් තුළ දී තමා වෙත සපයන ලෙස කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි අතර , ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

දිළිඳු සහන නැවැත්වීමට කොමසාරිස්වරයාට ඇති බලය.

7. මේ පනත අදාළවන යම් තැනැත්තකු විසින් තමා වෙත 5 වන වගන්තිය යටතේ කර ඇති යම් ප්‍රකාශයක අඩංගු යම් විස්තරයක් සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් අසත්‍ය හෝ වැරදි බවට සහ මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ ඒ තැනැත්තාට දිළිඳු සහන ප්‍රදානය කරනු ලැබීමට හිමිකමක් නැති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වූ අවස්ථාවක, 11 (1) වන වගන්තියේ විධිවිධානවලට හානියක් නොවන පරිදි, කොමසාරිස්වරයා විසින්, ඒ තැනැත්තාට දිළිඳු සහන ප්‍රදානය කිරීම වහාම නැවැත්විය යුතු අතර, ලියවිල්ලකින් වූ දැන්වීමකින්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව තුළ දී මේ පනත යටතේ සාදන ලද නියෝගවලට අනුව ඒ තැනැත්තාට දෙනු ලැබූ දිළිඳු සහනවල වටිනාකම ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

සිය තීරණය කොමසාරිස්වරයා විසින් දන්වා සිටිය යුතු බව.

8. (1) මේ පනත අදාළ වන තැනැත්තකුට දී ඇති දිළිඳු සහන නවතා දැමීමට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, සිය තීරණය ඔහු විසින් ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දන්වා සිටිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් 7 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම තීරණයක්ම 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අවසානාත්මක විය යුතු ය.

අභියාචන.

9. (1) 7 වන වගන්තිය යටතේ කරන ලද කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණය තමා වෙත දැනුම් දීමෙන් දින දහහතරක් ඇතුළත (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන්වනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) සෑම අභියාචනයක් ම ලේකම්වරයා ඇමතූ ලියවිල්ලකින් වූ පෙත්සමකින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එහි ඒ අභියාචනයට හේතු සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් ගැන කටයුතු කරමින්, ලේකම්වරයා විසින්, අභියාචනය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ කොමසාරිස්වරයාගේ කවර තීරණයකට විරුද්ධව ද ඒ තීරණය, ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ඉවතලීම කරනු ලැබිය හැකි ය.

7 වන වගන්තිය යටතේ ගෙවීමට නියම කරන ලද මුදල අයකර ගැනීම පිළිබඳ විධිවිධාන.

10. (1) මේ පනත යටතේ තමා වෙත දෙන ලද යම් දිළිඳු සහනයක මුදල ගෙවන ලෙස 7 වන වගන්තිය යටතේ දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කරනු ලැබ ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ ඒ මුදල නොගෙවන අවස්ථාවක හෝ ඒ මුදල ගෙවන ලෙස ඔහුට නියම කරන තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඒ අභියාචනය නිෂ්ප්‍රභ කිරීමෙන් දින තිහක් ඇතුළත ඒ මුදල නොගෙවන අවස්ථාවක, දැන්වීමේ නිශ්චිතව සඳහන් මුදල ගෙවීම පැහැර හැර ඇතියේ සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ කාර්ය සඳහා, ඒ මුදල ගෙවීම කළ යුතු තැනැත්තා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (අ) යම් මුදලක් පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හැරි මුදල පිළිබඳ විස්තර සහ මුදල ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාගේ නම ඇතුළත් වන සහතිකයක් කොමසාරිස්වරයා විසින් පැහැර හරින්නා පදිංචිව සිටින හෝ පැහැර හරින්නාට අයත් යම් චංචල දේපළක් පිහිටියා වූ යම් කොට්ඨාසයක අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ සහතිකයක් ලැබුනු පසු, මහෙස්ත්‍රාත්වරයා විසින්, සහතිකයේ නිශ්චිතව සඳහන් මුදල අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව තව දුරටත් නඩු කටයුතු කරගෙන නොයායුත්තේ මන්දැයි නිදහසට කරුණු දක්වනු පිණිස, ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවනු ලැබිය යුතු ය ; තව ද ප්‍රමාණවත් නිදහසට කරුණු පෙන්වීමක් පැහැර හැරිය විට, ඒ මුදල, බන්ධනාගාරගත කිරීමේ දඬුවමකින් දඬුවම් කළ නොහැකි සහ දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා ඒ පැහැර හරින්නාට මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් පනවන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර,

එවිට එවැනි වරදක් සඳහා පනවන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළ වූ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ (291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (එ) ඡේද හැර) 291 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය ; තවද, ඒ උපවගන්තියේ විධිවිධාන අනුව එවැනි දණ්ඩන නියමයක් පනවන අවස්ථාවේ දී මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි යම් විධානයක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන කවර වූ හෝ අවස්ථාවක, ඔහු විසින් වහාම පැහැර හරින්නා වෙත, පුද්ගලිකව භාර දීමෙන් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පණිවුඩ මාර්ගයෙන් ඒ බව දක්වෙන නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු නමුත්, පැහැර හරින්නා විසින් එවැනි නිවේදනයක් නොලැබීමෙන්, මේ වගන්තිය යටතේ ගනු ලබන නඩු කටයුතු නිෂ්ඵල කරනු නො ලැබිය යුතු ය.

වරදවල්

**11.** (1) 5 වන වගන්තිය යටතේ කරනු ලබන යම් ප්‍රකාශයක, අසත්‍ය හෝ වැරදි බව දැන දැනම තමාගේ හෝ සිය කලත්‍රයාගේ, දරුවන්ගේ හෝ යැපෙන්නන්ගේ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් වූ යම් විස්තරයක් කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු එකකට වැඩි නොවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) (අ) තමා වෙත 6 වන වගන්තිය යටතේ එවන ලද දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින ;

(ආ) එවැනි යම් දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීමේ දී දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි තොරතුරක් සපයන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

නියෝග.

**12.** (1) අමාත්‍යවරයා විසින් පහත දක්වෙන කරුණු සියල්ලම හෝ ඒවායින් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) නියම කරනු ලැබීමට මේ පනතෙහි නියම කර හෝ බලය දී ඇති සියලු කරුණු ;

(ආ) යම් පුද්ගලයකුට හෝ පවුලකට දිළිඳු සහන ප්‍රදානය සඳහා සුදුසුකම් පිළිබඳ කොන්දේසි ;

(ඇ) දිළිඳු සහන සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කළ යුතු ආකාරය ;

(ඈ) දිළිඳු සහන ප්‍රදානය සඳහා ඉල්ලුම් කරන තැනැත්තන් විසින් ඉටු කළ යුතු කොන්දේසි ;

(ඉ) මේ පනතේ කාර්ය සඳහා නියම කිරීමට හෝ කිරීමට නියම කර ඇති සියලු දැන්වීම්වල සහ ප්‍රකාශවල ආකෘතිය ;

(ඊ) මේ පනත යටතේ දිළිඳු සහන ප්‍රදානය සඳහා තාවකාලිකව තෝරා ගන්නා ලද තැනැත්තන්ගේ ලැයිස්තු පිළිබඳ කලින් කල කරනු ලබන, පළ කිරීම් ;

(උ) එවැනි යම් ලැයිස්තුවක යම් තැනැත්තකුගේ නමක් ඇතුළත් කිරීම කෙරෙහි විරුද්ධතා දැක්වීම පිණිස විධිවිධාන.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව හමුවට පමුණුවනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකෙරෙන එවැනි යම් නියෝගයක්, අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.